# විදුලි ඒකකයක උපරිම මිළ එක්වරක් පමණක් සංශෝධනය කිරීමේ (One time tariff re adjustment) ක්‍රමවේදය

**"කිලෝ වොට් 75 (AC) ධාරිතාවයෙන් යුතු සූර්යය ප්‍රකාශ වෝල්ත (Solar PV) විදුලි බලාගාර ස්ථාපනය කිරීම සඳහා ඉදිකිරීම, අයිතිය සහ පවත්වාගෙන යෑමේ (Build Own and Operate) පදනම මත යෝජනා කැඳවීම" යන තේමාව යටතේ 2021 මාර්තු 25 දින පල කරන ලද ටෙන්ඩර් කැඳවීම සහ ඊට අදාල පහත සඳහන් දැන්වීම් හා බැඳේ.**

a. **2021 මැයි 17 දින පල කරන ලද ටෙන්ඩර් භාර ගැනීමේ අවසන් දිනයන් දීර්ඝ කිරීමේ දැන්වීම**
b. **2021 ජුනි 10 දින පල කරන ලද විදුලි ඒකකයක් සඳහා ලංසු කැඳවනු ලබන උපරිම මිළ (Upper Benchmark tariff) සංශෝධනය සහ විනිමය අනුපාත උච්චාවචනය අනුව එක් වරක් පමණක් උපරිම මිළ ගණන් සංශෝධනය කිරීමේ ක්‍රමවේදය හඳුන්වා දීම**
c. **2021 ජුනි 18 දින පල කරන ලද ටෙන්ඩර් භාර ගැනීමේ අවසන් දිනයන් දීර්ඝ කිරීමේ දැන්වීම**

**1.** ඉහත සඳහන් ව්‍යාපෘතිය යටතේ 2021 මාර්තු මස 25 දින "දිනමිණ" පුවත්පතෙහි පළකරන ලද දැන්වීම, **2021 මැයි 17 දින පල වූ ටෙන්ඩර්පත් භාර ගන්නා අවසන් දිනය දීර්ඝ කිරීමේ දැන්වීම, 2021 ජුනි 10 දින පල කරන ලද විදුලි ඒකකයක් සඳහා ලංසු කැඳවනු ලබන උපරිම මිළ (Upper Benchmark tariff) සංශෝධනය සහ විනිමය අනුපාත උච්චාවචනය අනුව එක් වරක් පමණක් උපරිම මිළ ගණන් සංශෝධනය කිරීමේ ක්‍රමවේදය හඳුන්වා දීම සහ 2021 ජුනි 18 දින පල කරන ලද ටෙන්ඩර් භාර ගැනීමේ අවසන් දිනයන් දීර්ඝ කිරීමේ දැන්වීමට** වැඩිමනත් වශයෙනි.

**2.** විනිමය අනුපාතිකයන්ගේ උච්චාවචනය නිසා ව්‍යාපෘතියට වැයවන ප්‍රාග්ධන මුදලේ විදේශීය උපාංගවල මිළ විචලනය ගැලපීම සඳහා ව්‍යාපෘතිය සඳහා විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම් අත්සන් කිරීමේදී විදුලි ඒකකයක් මිලදී ගනු ලබන මිළ එක් වරක් පමණක් වෙනස් කිරීමට **(One time tariff re adjustment)** හඳුන්වා දුන් ක්‍රමවේදය 2021 මාර්තු 25 දින පලවූ ටෙන්ඩර් සඳහා අදාල නොවන බව ලංසු තැබීමට බලාපොරොත්තු වන ලංසුකරුවන් වෙත කාරුණිකව දන්වා සිටිමි. තවද මේ සම්බන්ධයෙන් සිදුවූ අපහසුතාවය පිළිබඳව කණගාටුව ප්‍රකාශ කර සිටිමි.

**3.** අනෙකුත් ටෙන්ඩර් පටිපාටියන් හා කොන්දේසි නොවෙනස්ව පවතී. ඉහත අයිතම අංක 02 හි සඳහන් සංශෝධනය (**Addendum**) පිළිබඳ විස්තර **http//www.ceb.lk/tender** ලංවිම වෙබ් පිටුව වෙත පිවිසීමෙන් ලබා ගත හැක.

**සාමාන්‍යාධිකාරී**
**ලංකා විදුලිබල මණ්ඩලය**

ලංකා විදුලිබල මණ්ඩලය
இலங்கை மின்சார சபை
CEYLON ELECTRICITY BOARD